## (3) දකුණු පළාත් සභාවේ 1989 අංක 04 දරන හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිසද ඊට සම්බන්ධ සහ අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මේ ප්‍රඥප්තිය 1989 අංක 04 දරන හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

කෙටි නාමය

**2.** (1) දකුණු පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ.
(2) රුපියල් දශ ලක්ෂයක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළ යුතු අතර, එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය.
(3) පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් කලින් කලට තීරණය කෙරෙන එවැනි මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

පළාතේ හදිසි අවස්ථා අරමුදල

**3**. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(2) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුගමනය කළ යුතුය.

අරමුදලෙන් අත්තිකාරම් ගෙවීම 20(2) වගන්තිය අනුව විය යුතුය

**4**. අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර, ඉන් කෙරෙන සියළු අත්තිකාරම් ගෙවීම් ඔහු විසින් කළ යුතුය.

අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතුය

1989 නොවැම්බර් මස 15 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.